# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය ( GIT )

## 7 ඒකකය - බහුමාධ්‍ය සංරචක ඇතුළත් කර වෙබ් අඩවි සංවර්ධනය කරයි.

1. වෙබ් අඩවියක මුල් පිටුව වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ පහත දැක්වෙන කවරක් මගින් ද?

(1) වෙබ් අඩවියේ සුචිය (index) ලෙසය.
(2) පිළිගැනීමේ (Welcome) පිටුව ලෙසය.
(3) වෙබ් අඩවියේ විස්තරයක් ලෙසය.
(4) වෙබ් අඩවියේ පළමුවන පිටුව ලෙසය.

2. HTML ලේඛනයක විවරණයක් (comment) ඇතුළත් කිරීම සඳහා නිවැරදි සලකුණු කිරීම (mark up) කුමක් ද?

(1) <! Districts of Sri Lanka>
(2) <! - - Districts of Sri Lanka - ->
(3) // Districts of Sri Lanka
(4) <* Districts of Sri Lanka *>

3. පහත දැක්වෙන URL ය සලකන්න.
http://www.schools.org/2012/lessons/index.html
ඉහත දැක්වෙන URL හි නියමාවලිය (protocol) දක්වනු ලබන්නේ පහත සඳහන් කුමක් මගින් ද?

(1) http (2) Html (3) www (4) Org

4. HTML පිටුවක ශීර්ෂය (heading) විදැහු (render) කිරීමට භාවිත කරන්නේ පහත සඳහන් කුමන උසුලනය ද?

(1) <h1> (2) <ol> (3) <ul> (4) <hr>

5. HTML උසුලන (tags) සම්බන්ධයෙන් පහත දක්වා ඇති වගන්ති වලින් නිවැරදි කුමක් ද?

(1) <br> යොදා ගනු ලබන්නේ පාඨ වලට (text) පෙර හා පසු හිස් පේළියක් (blank line) විදැහු කිරීමට යි.
(2) <p> යොදා ගනු ලබන්නේ පාඨ වලට (text) පෙර හා පසු හිස් පේළියක් විදැහු කිරීමට යි.
(3) <br> යොදා ගනු ලබන්නේ පාඨ වලට පෙර හිස් පේළියක් විදැහු කිරීමට යි.
(4) <p> යොදා ගනු ලබන්නේ පාඨ වලට පෙර හිස් පේළියක් විදැහු කිරීමට යි.

6. පහත දක්වා ඇති අවයවය (element), HTML ලේඛනයකට ප්‍රතිබිම්බයක් අඩංගු කිරීම සඳහා වූ සලකුණකි (markup). එහි යොදා ඇති ප්‍රතිබිම්බයෙහි ප්‍රභව ගොනුවේ නම "arrow.jpg" වන අතර මෙය HTML ලේඛනය පවතින ෆෝල්ඩරයේ ම පවතියි.

< img … = "ratnapura.jpg" >

(1) alt (2) src (3) width (4) href

7. වෙබ් අතරික්සුවක් (Web browser) මගින් විදැහු (render) කරන ලද පහත දක්වා ඇති ලැයිස්තුව සලකන්න.

1. Pineapple
2. Mango
3. Banana

ඉහත ලැයිස්තුව නිර්මාණය කිරීම සඳහා පහත සඳහන් කුමන HTML උසුලන භාවිතා කළ හැකි ද?

(1) <dd> (2) <dl> (3) <li> (4) <ol>

8. විශ්ව විසිරි වියමන (World Wide Web) සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න.

A - මෙය අන්තර්ජාලය හරහා ප්‍රවේශ විය හැකි එකිනෙකට සම්බන්ධ වූ අධිපාඨ (hypertext) ලේඛන එකතුවකි.
B - මෙය අන්තර්ජාලය හා සම්බන්ධ වූ පරිගණක මගින් තොරතුරු බෙදාහැරීම සඳහා වූ නියමාවලියකි (protocol).
C - මෙය විශ්ව විසිරි වියමන සංසදය (W3C) විසින් නිර්මාණය කරන ලද්දකි.


ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) A පමණි (2) C පමණි (3) A හා B පමණි (4) A හා C පමණි

9. වගුවක් නිර්මාණය කිරීම සඳහා වන පහත HTML කේතය සලකන්න.

```
<html>
<head><style> table,th,td{border:1px solid black} </style>
</head><body>
<table>
<tr><th> Name: </th> <td> Kamal </td> </tr>
<tr><th rowspan="2"> Telephone: </th> <td> 55577854 </td> </tr>
<tr><td> 55577855 </td> </tr>
</table>
</body>
</html>
```

ඉහත කේතය මගින් නිර්මාණය වන ප්‍රතිදානය පහත කවරක් ද?




10. පහත දැක්වෙන වගුව ගොඩනගනු ලබන්නේ කවර html කේතය මගින් ද?

Time Table

| Time | Monday | Tuesday |
|---|---|---|
| 8:00 - 9:00 | Mathematics | Science |

(1)

```
<caption>Time Table</caption>
<table border = "1">
        <thead>
                <tr>
                        <th>Time</th>
                        <th>Monday</th>
                        <th>Tuesday</th>
                </tr>
        </thead>
        <tr>
                <td>8:00 - 9:00</td>
                <td>Mathematics</td>
                <td>Science</td>
        </tr>
</table>
```

(2)

```
<table border = "1">
<caption>Time Table</caption>
<tr>
        <td>Time</td>
        <td>Monday</td>
        <td>Tuesday</td>
</tr>
<tr>
        <td>8:00 - 9:00</td>
        <td>Mathematics</td>
        <td>Science</td>
</tr>
</table>
```

(3)

```
<table border = "1">
        Time Table
        <tr>
                        <th>Time</th>
                        <th>Monday</th>
                        <th>Tuesday</th>
        </tr>
        <tr>
                <td>8:00 - 9:00</td>
                <td>Mathematics</td>
                <td>Science</td>
        </tr>
</table>
```

(4)

```
<table border = "1">
<caption>Time Table</caption>
        <tr>
                        <th>Time</th>
                        <th>Monday</th>
                        <th>Tuesday</th>
        </tr>
        <tr>
                <td>8:00 - 9:00</td>
                <td>Mathematics</td>
                <td>Science</td>
        </tr>
</table>
```

**<u>සකස් කළේ -</u>**

**රසික අත්තනායක මයා,**

**ර/ගෝණකුඹුර ම.වි.**